# අධිචෝදනා පත්‍රය.

## කොළඹ අධිකරණ කලාපයේ මහාධිකරණය.

නීතිපතිගේ අංකය:ඊ්ආර්/45/2008. මහාධිකරණයේ අපරාධ

නඩු අංකය: HC 4425/2008.

03 SEP 2009

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

විරුද්ධව.

ජයප්‍රකාශන් සිත්තප්පලම් තිස්සනායගම්.

***** **** ****

**කොළඹ මහාධිකරණය - අංක.01.**

**මහාධිකරණ විනිසුරු - දීපාලි විජේසුන්දර මැතිණිය ඉදිරියේදීය.**

**නඩු අංකය:HC. 4425/2008.**

**දිනය: 2009.08.31.**

(ල/ලේ. නාලිනී රත්නසිලි , මංජුලා අරන්ගල්ල, බී.එස්.එල්.කුමාරි

විසින් සටහන් කරන ලදි.)

## තී න් දු ව.

චූදිතට විරුද්ධව අධිචෝදනා පත්‍රයෙන් චෝදනා කර ඇත්තේ,

01. වර්ෂ 2006 ක්වූ ජූනි මස 01 වන දින හා වර්ෂ 2007 ක්වූ ජූනි මස 01 වන දින අතර කාලසීමාව තුළදී මෙම අධිකරණයේ බලසීමාව තුළ පිහිටි කොළඹ හිදී යුප්මතා පැමිණිල්ල නොදත් අන් අය සමඟ යම් අපරාධයක් සිදුකිරීම හෝ සිදුකිරීම සඳහා වරදකට අනුබල දීමේදී හෝ අනුබල දීම සඳහා පොදු අරමුණක් සහිතව කලින් සම්මතයක් හෝ පිළියෙල වීමක් ඇතිව හෝ නැතිව

එනම්, යම් කියවනු ලබන නැතහොත් කියවීමට අදහස් කරනු ලැබූ වචන මගින් හෝ සංඥා මගින් හෝ දෘෂ්‍ය නියෝජන මගින් හෝ අන්‍යාකාරයෙන් සාහසික ක්‍රියා ඇතිවීමට සැලැස්වීමෙන් හෝ ඇතිවීමට සැලැස්වීමට අදහස් කිරීමෙන් එනම්, ජාතිවාදී හැඟීම් ඇවිස්සෙන ආකාරයේ ලේඛණයක් වන North Eastern Monthly සඟරාව සංස්කරණය කිරීම, මුද්‍රණය හෝ බෙදාහැරීම සඳහා අපරාධය සිදුකිරීමට හෝ අනුබල දීමට එකඟවූ බැවින් යුප්මතා පැමිණිල්ල නොදත් අන් අය සමඟ ඉහත කී අපරාධය සිදුකිරීමට කුමන්ත්‍රණය කළ බවද, එකී කුමන්ත්‍රණයේ ප්‍රතිඵලයක් වශයෙන් එකී අපරාධය සිදුකර ඇති බැවින්, යුප්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වන වගන්තිය සමඟ කියවෙන 1988 අංක.22 සහ 1982 අංක. 10 දරණ පනත්වලින් සංශෝධිත 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2(1)(ඌ) වගන්තිය සමඟ කියවිය යුතු 2 (2) (ii) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකළ බවය.

03 ... 2009

02. ඉහත කී වේලාවේදී, ස්ථානයේදී හා එම ක්‍රියාකලාපයේදීම යුප්මතා කියවනු ලබන නැතහොත් කියවීමට අදහස් කරනු ලැබූ වචන මගින් හෝ සංඥා මගින් හෝ දෘෂ්‍ය නියෝජන මගින් හෝ අන්‍යාකාරයෙන් සාහසික ක්‍රියා ඇතිවීමට සැලැස්වීමෙන් හෝ ඇතිවීමට සැලැස්වීමට අදහස් කිරීමෙන් එනම්, ජාතිවාදී හැඟීම් ඇවිස්සෙන ආකාරයේ North Eastern Monthly සඟරාව සංස්කරණය කිරීම, මුද්‍රණය හෝ බෙදාහැරීම එනම්, x උපලේඛණයේ සඳහන් ලිපි පළකිරීමෙන් 1988 අංක 22 සහ 1982 අංක 10 දරණ

පනත්වලින් සංශෝධිත 1978 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2(1)(උ) වගන්තිය සමග කියවිය යුතු (2) (2) (ii) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකළ බවය.

03. ඉහතකී වේලාවේදී, ස්ථානයේදී හා එම ක්‍රියාකලාපයේදීම යුප්මතා ත්‍රස්තවාදය සඳහා මුදල් ගෙවීමක් හෝ මුදල් එකතු කිරීමෙන් හෝ ආධාර කරන්නාවූ හෝ උපකාර කිරීමෙන් හෝ යෙදවීමෙන් North Eastern Monthly සඟරාව සඳහා මුදල් එකතු කිරීමෙන් 2006 දෙසැම්බර් 06 වන දිනැති අංක. 1474/5 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (අතිවිශේෂ) ප්‍රකාශිත 2006 අංක 7 දරණ හදිසි අවස්ථා (ත්‍රස්තවාදය හා විශේෂිත ත්‍රස්තවාදී ක්‍රියා වැළැක්වීම සහ තහනම් කිරීම) නියෝගයන්හි 6 (ඇ) නියෝගය සමග කියවිය යුතු 10 වන නියෝගය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකළ බවය.

මෙම චෝදනාවන් ඔප්පු කිරීම සඳහා පැමිණිල්ලෙන් සාක්ෂිකරුවන් 10 දෙනෙකුගේ සාක්ෂි කැඳවූ අතර, "පැ.1 සිට පැ.28 දක්වා, පැ.2(1) සිට පැ 2 (8) දක්වාද, පැ.3, පැ.4" ලේඛණද ලකුණු කර ඉදිරිපත් කරන ලදී. චූදිත වෙනුවෙන් චූදිත විත්ති කූඩුවේ සිට ප්‍රකාශයක් කළ අතර, සාක්ෂිකරුවන් 8 දෙනෙකුගේ සාක්ෂි මෙහෙයවන ලදී. ඊට අමතරව "වි.1 සිට වි.30" දක්වා ලේඛණ ලකුණු කරන ලදී.

පැමිණිල්ලෙන් මුලින්ම ඉදිරිපත් කරන ලද සාක්ෂිය නම් සහකාර පොලිස් අධිකාරී ආනන්ද රාජ් රණසිංහගේ සාක්ෂියයි. චූදිත විසින් ඔහුට කරන ලද පාපෝච්චාරණය "පැ.1" ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. මෙම අධිචෝදනා පත්‍රයේ චෝදනාවලට අදාල කොටස් සහිත පිටු "පැ.1 සිට පැ.22" දක්වා ලකුණු කරමින්, එකී පාපෝච්චාරණයේ එම චෝදනාවන් ඔප්පු කිරීමට අදාල වන කොටස් "පැ.1(අ) සිට පැ.1(ඒ)" දක්වා ලකුණු කරන ලදී. එම පාපෝච්චාරණය චූදිත දෙමළ භාෂාවෙන් සිදුකිරීමෙන් අනතුරුව සාක්ෂිකරු විසින් එය සිංහල භාෂාවට පරිවර්තනය කිරීම උප පොලිස් පරීක්ෂක රාසික් මාර්ගයෙන් සිදුකර ඇත. ඉන් අනතුරුව ඔහු එම පාපෝච්චාරණයෙන් හෙළිදරව් වූ කාරණා සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට අදාල අංශවලට යොමුකර ඇත. මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී පාපෝච්චාරණයේ කපාහරින ලද සටහන්වල චූදිතගේ කෙටි අත්සන යොදා ඇති බවත්, නමුත් එක් ස්ථානයක පමණක් කෙටි අත්සන නොමැති බවත් පිළිගෙන ඇත.

03 SEP 2009
මහාධිකරණය

පොලිස් පරීක්ෂක හරේන්ද්‍ර ජනකාන්ත මෙම චූදිත සම්බන්ධ චෝදනාව විමර්ශනය කිරීම සඳහා මූලිකව කටයුතු කර ඇති නිලධාරියෙකි. මෙම විමර්ශනය සිදුකරන අවස්ථාවේදී ඔහු ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ අවුරුදු 9 ක පමණ කාලයක් සේවය කර ඇති අතර, ඔහු මෙවැනි විමර්ශන සඳහා පළපුරුද්දක් ඇති පොලිස් නිලධාරියෙක් ලෙස සැලකිය හැකිය. 06.03.2008 වෙනි දින ලැබුනු තොරතුරක් අනුව පොලිස් පරීක්ෂක ජනකාන්ත, එල්.ටී.ටී.ඊ. බුද්ධි අංශයේ සාමාජිකයෙකු කොළඹට පැමිණ ඇති බව දැනගැනීමට ලැබී ඔහු අත්අඩංගුවට ගැනීමට කටයුතු කර ඇත. ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් විමර්ශන කටයුතු කිරීමේදී ජයප්‍රකාශන් සිත්තම්පලම් තිස්සනායගම්, නාගරාජා උදයන්, කිත්සිරි විජේසිංහ සහ ගයාන් ලසන්ත යන අය ගැන

03 SEP 2009

සොයා බැලීමට ඔහු ඔවුන්ගේ නිවෙස්වලට ගොස් ඇත. 07.03.2008 වෙනි දින පැය 3.50 ට 16/බී, තක්ෂිලා පෙදෙස, කිරුළපන, කොළඹ 06 යන ස්ථානයේ පිහිටි චූදිතගේ ගෙදරට ඔහු සොයාගෙන ගොස් ඇත. එකී නිවසේ ගේට්ටුවට ඉබියතුරු දමා තිබී ඇති අතර, නිවසේ කිසිවෙක් සිට නැත. එදිනම පැය 18.50 ට ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේදී මෙම පොලිස් පරීක්ෂකවරයා චූදිතව අත්අඩංගුවට ගෙන ඇත. විත්ති කූඩුවේ සිටින පුද්ගලයා ඔහු අත්අඩංගුවට ගත් සැකකරු ලෙස ඔහු හඳුනා ගන්නා ලදී. චූදිතව අත්අඩංගුවට ගත්තේ එල්.ටී.ටී.ඊ. සංවිධානය සමඟ මුදල් ගනුදෙනු කරමින් එම සංවිධානයේ උපදෙස් පරිදි රෙනයිපන්ස් පබ්ලිකේෂන් ලිමිටඩ් සහ අවුට්රීච් මීඩියා යන ආයතනවල අධ්‍යක්ෂවරු ලෙස කටයුතු කිරීම යන වරද කියාදීමෙන් පසුව බව මෙම පොලිස් පරීක්ෂකවරයා කියා සිටින ලදී. චූදිත අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහු සන්තකයේ තිබී නොකියා 1112 වර්ගයට අයත් අංක. 359736/06/179648/7 දරණ ජංගම දුරකථනය, ජාතික හැඳුනුම්පත සහ අවුට්රීච් මල්ටිමීඩියා ආයතනයේ හැඳුනුම්පත අත්අඩංගුවට ගෙන ඇත. එම ජංගම දුරකථනයේ අංකය 0773059503 දරණ ඩයලොග් සම්බන්ධතාවයක් තිබූ දුරකථනයක් බවත්, එහි ලියාපදිංචි අයිතිකරු ලෝරන්ස් ඉන්ද්‍රරාජ් රත්නසභාපති බවත් සාක්ෂිකරු අනාවරණය කරගෙන ඇත. චූදිත සන්තකයේ තිබී අත්අඩංගුවට ගන්නා ලද මෙම දුරකථනය දේපල කුවිතාන්සි පොතට ඇතුලත් කර නඩු භාණ්ඩයක් වශයෙන් භාරදී ඇත. මෙම චූදිතට හොඳින් සිංහල භාෂාව කථා කිරීමට හැකියාවක් තිබූ බවත්, අත්අඩංගුවට ගැනීමෙන් පසු සිංහල භාෂාවෙන් කරන ලද ප්‍රකාශයක් සටහන් කර පසුව චූදිත ද්‍රවිඩ ජාතිකයෙක් වූ බැවින් උප පොලිස් පරීක්ෂක රාසික්ගේ සහාය ඇතිව එම ප්‍රකාශය දෙමළ භාෂාවෙන් කියවා දුන් බවත් කියා සිටින ලදී. මෙම සාක්ෂිකරුගේ අංශයේ නිලධාරීන් චූදිත සේවය කළ අවුට්රීච් මල්ටිමීඩියා

ආයතනයට ගොස් පරීක්ෂණ පවත්වා ඇත. චූදිත අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව ඔහු ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ 3 වෙනි අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක අල්විස්ගේ කාමරයට සාක්ෂිකරු ඔහු ගෙන ගොස් ඇති අතර, ස්ථානාධිපති විසින් පැය 2 ක් පමණ කාලයක් චූදිතගෙන් ප්‍රශ්න කර ඇත. 07.03.2008 වෙනි දින චූදිතගේ ප්‍රථම ප්‍රකාශය සටහන් කිරීමෙන් පසු ඔහුගේ ඊලඟ ප්‍රකාශය 07.04.2008 වෙනි දින සටහන් කර ඇත.

03 SEP 2009 මහාධිකරණය

චූදිත ඔහුගේ ඇසේ රෝගයක් ගැන පැමිණිලි කිරීමෙන් අනතුරුව ඔහුව 24.03.2008 වෙනි දින අධිකරණ වෛද්‍ය නිලධාරී වෙතටද, ඔහුගේ නියමය පරිදි 25.03.2008 සහ 26.03.2008 යන දිනයන්හි අක්ෂි රෝහලටත් ඉදිරිපත් කර ඇත. පොලිස් පරීක්ෂක ජනකාන්ත පවසා සිටියේ 08.09.2008 වෙනි දින චූදිත විසින් කරන ලද පාපෝච්චාරණය සටහන් කිරීම සම්බන්ධයෙන් ඔහු නොදන්නා බවයි. 05.05.2008 වන දින පොලිස් පරීක්ෂක ජනකාන්තගේ විමර්ශණ නිලධාරියෙක් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයට ගොස් සඟරාවන් ලියාපදිංචි කිරීම ගැන විමර්ශන කර ඇත. ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ යම්කිසි පුද්ගලයෙක් රඳවාගෙන සිටින විට ඔහු භාරව නිතරම නිලධාරියෙක් සිටින බවත්, ඔහුගේ සියළුම ගමන්බිමන් මෙම නිලධාරියා සටහන් කරන බවත්, එම නිලධාරියාගේ අනුදැනුම නොමැතිව රැඳවියන්ට එම කොට්ඨාශය තුළ එහා මෙහා යාමට නොහැකි බවත්, රැඳවියන් බැලීමට පැමිණෙන පුද්ගලයින් ගැනද පොතක සටහන් යොදන බවත් මෙම සාක්ෂිකරු විස්තර කරන ලදී.

**විජිතයාපා පොත්හලේ සාමාන්‍යාධිකාරී සිරිවර්ධන මීලඟට පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දෙමින්,** North Eastern Monthly සඟරාව ඔහුගේ ප්‍රධාන ශාඛාවට මසකට පිටපත් 50 ක් පමණ අවුරුදු තුන හතරක කාලයක සිට එම සඟරාව පළකරන

සංගමය විසින් භාරදුන් බව කියා සිටින ලදී. එම සඟරාව විකුණා ලැබෙන මුදල්, සටහන් අනුව තිස්සනායගම් නැමති පුද්ගලයෙකුට භාරදුන් බවට මෙම සාක්ෂිකරු කියා සිටින ලදී. රෙනයිසන්ස් පබ්ලිකේෂන් නැමති ආයතනය තිස්සනායගම්ට අයත් සමාගමක් බවත්, මෙම සඟරා විකුණා ලැබෙන මුදල් වලින් 2007 ජූනි 14 වෙනි දින සකස් කරන ලද චෙක්පත රුගෙන නොගිය බවත් ඔහු කියා සිටින ලදී. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විත්තිය විසින් අභියෝගයට ලක් නොකළ අතර, ඔහුගෙන් විත්තියෙන් හරස් ප්‍රශ්න නොඅසන ලදී. මෙම සාක්ෂියෙන් North Eastern Monthly සඟරාව චූදිත විසින් විකිණීම සඳහා මෙම පොත්හලට භාරදී ඇති බවත්, පසුව විකුණා ලැබෙන මුදල් ඔහු විසින් භාරගත් බවත් ඔප්පු වී ඇත.

රත්නසභාපති නැමති සාක්ෂිකරු සාක්ෂි දෙමින්, ඔහු ජංගම දුරකථන සම්බන්ධතා 5 ක් ඩයලොග් ආයතනයෙන් ලබාගෙන තිබූ බවත්, එම දුරකථන අංක 5 ම ඔහු පාවිච්චි නොකරන බවත්, 0773059503 නැමති අංකය ඔහුගේ නමට අවුරුදු 4, 5 ක පමණ කාලයකට පෙර ලබාගත් බවත්, එහි සිම් එක ඔහු අවුරුදු තුනකට පමණ කලින් ජයප්‍රකාශන් තිස්සනායගම්ට දුන් බවත් අධිකරණයේදී කියා සිටින ලදී. එම අංකයට දුරකථන බිල්පත් පැමිණි විට එම බිල්පත් ඔහු තිස්සනායගම්ට ගෙන ගොස් දී ඇත. විත්ති කූඩුවේ සිටින පුද්ගලයා එකී සඳහන් කරන ලද තිස්සනායගම් බවත්, ඔහු තමාගේ මිත්‍රයෙක් බවත්, චූදිතගේ සහෝදරයා මාර්ගයෙන් ඔහු හඳුනාගත් බවත් පවසමින්, තමා දන්නා කිසිවෙක් කිලිනොච්චියේ නොමැති බවත්, 021 2285179 දරණ දුරකථන අංකය ඔහු නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී. තිස්සනායගම්ට එම සිම් එක දුන් පසු ඔහු එම සිම්එක පාවිච්චි නොකරන ලද බව සාක්ෂිකරු කියා සිටින ලදී. චූදිත අත්අඩංගුවට ගත් බව දැනගැනීමෙන් අනතුරුව තමා ඩයලොග් ආයතනයට, ඔහුගේ නමට තිබෙන සිම්

එකක් චූදිත පාවිච්චි කරන බව දන්වා නොසිටි බව කියා සිටින ලදී. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් චූදිත අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහු සන්තකයේ තිබී සොයාගන්නා ලද දුරකථනය මෙම සාක්ෂිකරුගෙන් ලබාගත් දුරකථනයක් බවත්, චූදිත එකී දුරකථනය වසර තුනකට ආසන්න කාලයක සිට පාවිච්චි කල බවත් ඔප්පු වී ඇත.

ඩයලොග් ආයතනයේ විමර්ෂණ සහකාර මෙහෙයුම් නිලධාරී රුවන් රත්නායක සාක්ෂි දෙමින් කියා සිටියේ, 0773059503 සිම් අංකය ඔවුන්ගේ ආයතනයෙන් එල්.අයි.රත්නසභාපති නැමැති අයකුට නිකුත් කරන ලද බවත්, අධිකරණ නියෝගයක් මගින් මෙම දුරකථන අංකයට අදාල දත්තයන් පිළිබඳව වාර්තාවක් සකස් කල බවත්, එය විමර්ෂන නිලධාරියාට බාර දුන් බවත් පවසමින් එහි ඡායා පිටපතක් ඔහු සකස් කරන ලද වාර්තාවේ පිටපතක් බවට හඳුනා ගන්නා ලදී. මෙම සිම්පතේ ලියාපදිංචි අයිතිය වෙනස් කිරීමට අයිතිකරු කිසිම අවස්ථාවක ඉල්ලීමක් කර නැත. මෙම සාක්ෂිකරුගෙන්ද විත්තියෙන් හරස් ප්‍රශ්න නොඅසන ලදී. මෙම සාක්ෂියෙන් චූදිත අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේදී ඔහු සන්තයේ තිබී සොයා ගන්නා ලද දුරකථනය එල්.අයි. රත්නසභාපතිට අයත් දුරකථනයක් බවට තහවුරු වී ඇත. එකී රත්නසභාපති සාක්ෂි දෙමින් මෙම දුරකථනය ඔහු මීට අවුරුදු 3 කට පෙර බාරදී විත්තිකාර තිස්සනායගම් පාවිච්චි කල බව කියා සිටින ලදී. මේ අනුව 0773059503 දරණ දුරකථනය චූදිත විසින්ම පාවිච්චි කරන ලද දුරකථනයක් බවට සාක්ෂි වලින් ඔප්පුවී ඇත.

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ඉංජිනේරු ප්‍රියන්ත මනෝරත්න සාක්ෂි දෙමින්, දුරකථන අංක. 021 2285179 අංකය ටෙලිකොම් ආයතනයට අයත් කිලිනොච්චි

ප්‍රදේශයේ අංකයක් බවත්, එහි පාරිභෝගිකයා ලෙස කේ.ඥානකුමාර් යන අයගේ නම සඳහන් වී ඇති අතර, එය නිවසකට නිකුත් කරන ලද දුරකථනයක් බවත් කියා සිටින ලදී. මෙහි පළමුවන බිල 15.02.2006 වන දින ගෙවා ඇති බවත්, 01.07.2008 වන දින සිට මෙම අංකය අක්‍රියව තිබෙන බවත් ලේඛණ අනුව සාක්ෂි දෙමින් කියා සිටින ලදී. මෙයින් චූදිත විසින් පාවිච්චි කරන ලද දුරකථනයට දුරකථන ඇමතුම් ලැබී ඇති 021 2285179 දුරකථනය කිලිනොච්චි ප්‍රදේශයේ දුරකථනයක් බවට තහවුරු වී ඇති අතර, චූදිත අත්අඩංගුවට ගැනීමෙන් පසු මෙය ක්‍රියාවිරහිත කර ඇති බව පෙනී යයි.

අළුත්කඩේ හැටන් නැෂනල් බැංකුවේ කළමණාකාර වික්‍රමසිංහ ගුණරත්න සාක්ෂි දෙමින්, අංක. 0010361217 දරණ ජංගම ගිණුම රෙනයිපන් පබ්ලිකේෂන් ලිමිටඩ් යන ආයතනය විසින් සීමාසහිත සමාගම ආරම්භ කරන ලද බවත්, එහි අධ්‍යක්ෂවරු තුන්දෙනෙක් සිටින බවත්, ඔවුන් නම් වශයෙන් බාලසුබ්‍රමනියම් වසන්ත, ජයප්‍රකාශන් තිස්සනායගම් සහ වෙට්ටිවේල් ජෙසිකරන් බවත් කියා සිටින ලදී. එම ගිණුම විවෘත කරන අවස්ථාවේ දෙන ලද මැන්ඩේට් පත්‍රය "<u>පැ.2(1)</u>" වශයෙන් ලකුණු කරන ලදි. සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද එකී සමාගම ලියාපදිංචි කරන ලද ලියවිල්ල "<u>පැ.2(2)</u>" වශයෙන්ද, එහි සමාගම් සංග්‍රමික සංස්ථා පත්‍රයේ ව්‍යවස්ථාවලියේ පිටපත් "<u>පැ.2(3)</u>" වශයෙන්ද, සංස්ථාවක් ලෙස නීතිගත කරන ලද ලියවිල්ල "<u>පැ.2(4)</u>" වශයෙන්ද, අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියේ පිටපතක් "<u>පැ.2(5)</u>" වශයෙන්ද ලකුණු කර ඉදිරිපත් කරන ලදී. මෙම ලේඛණ සියල්ලේම ජයප්‍රකාශන් සිත්තම්පලම් තිස්සනායගම් යන අය අධ්‍යක්ෂවරයෙක් ලෙස සඳහන් වී ඇත. මෙම ගිණුම 02.08.2004 වෙනි දින ආරම්භ කර ඇත. මෙම ලේඛණවලින් රෙනයිපන් පබ්ලිකේෂන් ලිමිටඩ් යන ආයතනයේ චූදිත අධ්‍යක්ෂවරයෙක් ලෙස ක්‍රියාකළ

බවත්, එහි මුදල් ගනුදෙනු සඳහා ඔහු කටයුතු කල බවත් පෙනී යයි. මෙම ගිණුමේ මාසික ගිණුම් ප්‍රකාශ සම්බන්ධයෙන් කිසිම පැමිණිල්ලක් ගිණුම් හිමියන්ගෙන් නොලැබුනු බවත් කලමණාකරු තවදුරටත් සාක්ෂි දෙමින් කියා සිටින ලදී.

03 SEP 2009

12.03.2007 වෙනි දින රුපියල් 50,000/- ක මුදලක් හැටන් නැෂනල් බැංකුව පිටකොටුව ශාඛාවෙන් මුදලින් මෙම ගිණුමට බැරකර ඇති බවත්, 30.04.2007 වෙනි දිනද රුපියල් 50,000/- ක මුදලක් හැටන් නැෂනල් බැංකුව හෙට්ටිවීදිය ශාඛාවෙන් මෙම ගිණුමට බැරකර ඇති බවත්, ඒවායේ ලදුපත්වල බැරකල පුද්ගලයාගේ නමක් සඳහන් නොවන බවත් මෙම සාක්ෂිකරු කියා සිටින ලදී. 08.05.2007 වෙනි දින අංක. 51797609 දරණ මෙම සමාගමේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් අත්සන් කරන ලද චෙක්පතකින් රුපියල් ලක්ෂයක මුදලක් හැටන් නැෂනල් බැංකුව කොටහේන ශාඛාවෙන් ලබාගෙන ඇත. එම අත්සන් දෙකෙන් පළමුවන අත්සන තිස්සනායගම්ගේ සහ දෙවෙනි අත්සන ජෙසිකරන්ගේ බවට කලමණාකරු විසින් හඳුනා ගන්නා ලද අතර, එකී චෙක්පත "පැ.2(6)" වශයෙන් ලකුණු කරන ලදී. 25.06.2007 වන දිනද මෙම ගිණුමට හැටන් නැෂනල් බැංකුව වැල්ලවත්ත ශාඛාවෙන් රුපියල් 50,000/- ක මුදලක් මුදලින් බැරකර ඇත. එදිනම චෙක්පත් අංක. 51797618 මගින් හැටන් නැෂනල් බැංකුව කොටහේන ශාඛාවෙන් රුපියල් 50,000/- ක මුදලක් ලබාගෙන ඇති අතර, චෙක්පතේ අත්සන් කර ඇත්තේ තිස්සනායගම් සහ ජෙසිකරන් බව පවසමින් එකී චෙක්පත "පැ.2(7)" වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන ලදී. මෙම ගිණුමේ දත්තයන් සම්බන්ධයෙන් සාක්ෂිකරු සකස් කරන ලද ලියවිල්ල "පැ.2(8)" වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන ලදී. මෙම සාක්ෂිකරුගෙන් විත්තිය විසින් හරස් ප්‍රශ්න නොඅසන ලද අතර, ඔහුගේ සාක්ෂිය අභියෝගයට ලක් නොකරන ලදී. මෙම චෙක්පත් වලින් විත්තිකරු විසින් එම ගිණුමේ